# ශ්‍රී ලංකාවේ පහළ ප්‍රාථමික පංති කාමර අධ්‍යාපන ක්‍රියාවලියේ ඵලදායිතා වර්ධනය සඳහා දෙමාපිය සහාය යොමු කර ගන්නා ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

කොළඹ විශ්ව විද්‍යාලයේ
අධ්‍යාපන දර්ශනපති (M/Phil)
උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන
පර්යේෂණ නිබන්ධනය.

ලියාපදිංචි අංකය: 85/M.Phil/01

එම්. විජය ලක්ෂ්මී පෙරේරා
ශාස්ත්‍රවේදී උපාධිය (කොළඹ විශ්ව විද්‍යාලය)
අධ්‍යාපන ඩිප්ලෝමා (සම්මාන)
පශ්චාත් උපාධිය (කොළඹ විශ්ව විද්‍යාලය)
පුහුණු 1 ( මියුසියස් ගුරු විදුහල)

අධ්‍යාපන පීඨය,
කොළඹ විශ්ව විද්‍යාලය,
කොළඹ 03.

UCLIB
462758
462758

## සංක්ෂේපයෙන්

වර්තමාන ලෝකයේ බොහෝ රටවල් සිය පහළ ප්‍රාථමික අධ්‍යාපන අවස්ථාව කෙරෙහි විශේෂ අවධානයකින් ක්‍රියා කරන පරිවයක් විද්‍යමාන වේ. මෑත දශක කිහිපයක් වනතුරු ප්‍රාථමික අධ්‍යාපන අවස්ථාව අමතක කර සිටීමේ අහිතු විපාක කෙරෙහි අවධාන යොමු වෙමින් පවති. විශේෂයෙන්ම පහළ ප්‍රාථමික අධ්‍යාපන අවස්ථාවෙහි සාඵල්‍යතාව උදෙසා නොයෙකුත් නවීකරණ ක්‍රියාමාර්ග අනුගමනය කෙරෙන අතර, තවදුරටත් එහිලා සැළකිලිමත් වනු දැකිය හැකි වෙයි.

විධිමත් අධ්‍යාපන ක්ෂෙත්‍රයට පිවිසෙන හැම දෙනෙකුම වාගේ පසුකළ යුතු පහළ ප්‍රාථමික අධ්‍යාපන අවධිය එහිලා සහභාගි වන සියලු දෙනාගේ අධ්‍යාපනික ගමන් මග කෙරෙහි අතිශයින් වැදගත් වීම පිළිබඳව විවාදයක් නොමැතිය. මෙම අවධිය සංවේදී බවින් යුතුව අත්දැකීමෙන් ඉගෙනුම සැළසෙන ලෙසින් ක්‍රියාත්මක වීම සඳහා දරුවාගේ ප්‍රථම ගුරුවරුන් වන දෙමාපියන් අධ්‍යාපනයේ කොටස්කරුවන් විය යුතුව ඇත.

මාපියන්, දරුවන් හා ගුරුවරුන්ගේ සපිවි සහභාගිත්වයේ අවශ්‍යතාව අද ශ්‍රී ලංකාවේ පහළ ප්‍රාථමික අධ්‍යාපන ක්ෂෙත්‍රය තුළ දැඩිව උද්ගත වෙමින් පවති.

මෙම අධ්‍යයනයෙන් පහළ ප්‍රාථමික අධ්‍යාපන ක්‍රියාවලියෙහි සාඵල්‍යතා වර්ධනය සඳහා දෙමාපිය සහයෝගිත්වයේ අවශ්‍යතාවයත්, වැදගත්කමත් සාර්ථකත්වයත් විමසෙන අතර පහළ ප්‍රාථමික අධ්‍යාපනය සඳහා දෙමාපිය සහාය යොමුතර ගන්නා ආකාරය ද පරීක්ෂාවට ලක් කෙරිණි.

මෙම අධ්‍යයනය තුළින් යෝජිත කාර්ය සංසිද්ධිය පරිච්ඡේද හතකින් ඉදිරිපත් කර ඇත. ප්‍රථම පරිච්ඡේදයෙන් පහළ ප්‍රාථමික අධ්‍යාපන අවධිය හා දෙමාපිය සභාය පිළිබඳ හැඳින්වීමක් කර ඇති අතර අධ්‍යයනයේ වැදගත්කම හා අරමුණු පිළිබඳ විග්‍රහයක් ද යෙදිනි. මෙහිදී අධ්‍යයන අරමුණු වශයෙන්,

01. විධිමත් අධ්‍යාපන පද්ධතියේ පහළ ප්‍රාථමික අධ්‍යාපන අවස්ථාවට හිමි වන ස්ථානය හා ඒ සඳහා යොමු වෙන ගුරු කාර්ය භාරයේ ස්වරූපය

02. විෂයමාලා ක්‍රියාකාරීත්වයේදී දෙමාපිය සභායේ අවශ්‍යතාව.

03. දෙමාපිය සභාය තුළින් පහළ ප්‍රාථමික අධ්‍යාපන අවස්ථාවට ලබා ගත හැක විපුල ප්‍රයෝජන

04. සාඵල්‍යතා වර්ධනය සඳහා දෙමාපිය සභායේ ඇති බලපෑම් හා

05. දෙමාපිය සභාය ළඟා කර ගත යුතු ආකාරය ද විග්‍රහ විනි.

දෙවන පරිච්ඡේදයේ විධිමත් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පහළ ප්‍රාථමික අධ්‍යාපන අවස්ථාවට හිමි තැන හා පහළ ප්‍රාථමික විෂය මාලාවේ ස්වභාවය පරීක්ෂාවට ලක්කෙරිණි. තුන්වන පරිච්ඡේදයෙන් පහළ ප්‍රාථමික විෂයමාලා ක්‍රියාකාරීත්වය උදෙසා දෙමාපිය සභායේ අවශ්‍යතාව විමර්ශණය කොට ඇත. එම විමසුමෙන් පහළ ප්‍රාථමික විෂය මාලා ක්‍රියාකාරීත්වයේ සාර්ථකත්වය සඳහා දෙමාපිය සභාය අවශ්‍ය බවත්, දෙමාපිය සභාය නොමැතිව සාර්ථකව පරිසරානුබද්ධව විෂය මාලාව මෙහෙයවිය නොහැකි බවත් හෙළිකර ගත හැකි විනි.

හතරවන පරිච්ඡේදයෙන් ඈත අතීතයේ සිට ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශයන් –හිත්, මූලික අධ්‍යාපනය හා බැඳුණු දෙමාපිය සහායේ ස්වභාවයත්, එදා සමාජයට දෙමාපිය සහායේ වැඩදායකතාවත් විමසුමට ලක් කෙරිණි. පස්වන පරිච්ඡේදයෙන් අධ්‍යයන ක්‍රම පිළිවෙත පැහැදිලි කර ඇති අතර හයවැනි පරිච්ඡේදයෙන් ප්‍රතිශත හා සංඛ්‍යා විද්‍යාත්මක ක්‍රම උපයෝගි කරගනිමින් දත්ත විශ්ලේෂණය කෙරිණි. එම විශ්ලේෂණයේදි

01. පන්ති කාමර අවශ්‍යතා සපුරා ගැනීම
02. විෂයමාලා ක්‍රියාකාරීත්වයේ කොටස්කරුවන් කර ගැනීම
03. අවශ්‍ය ක්‍රියාකාරකම් හි දරුවා රඳවා තබා ගැනීම
04. අධ්‍යාපනයට යෝග්‍ය මානසික සංතෘප්තිය දරුවාට ළඟා කර දීම.
05. අධ්‍යාපන සාඵල්‍යතා වර්ධනය යන කාර්ය සංසිද්ධීන් සඳහා දෙමාපිය සහායේ අවශ්‍යතාවය අවධාරණය විණි.

මෙහිලා පහළ ප්‍රාථමික පන්ති කාමර ක්‍රියාකාරකම්හි නියැළි 200 ක ගුරු නියැදියකට යොමු කෙරුණු ප්‍රශ්නාවලියෙන් ලැබුණු දත්ත විමසුමෙන් පහළ ප්‍රාථමික පන්ති කාමර ක්‍රියාකාරකම්හිදි දෙමාපිය සහාය අවශ්‍ය බවත්, දෙමාපියන් ඈත් කර සාර්ථක පහළ ප්‍රාථමික අධ්‍යාපන ක්‍රමයක් ක්‍රියාත්මක කළ නොහැකි බවත්, දෙමාපියන් ළඟාකර ගැනීම නිසියේත් පහළ ප්‍රාථමික අධ්‍යාපනයට බාධාවක් නොවන බවත් අවධාරණය විණි.

අධ්‍යාපන සාධන සාඵල්‍යතා විමර්ශණය සඳහා උපරිමව හා අවමව දෙමාපිය සහාය ලබමින් ඉගෙනීමේ යෙදුණු සිසු නියැදි දෙක, පරීක්ෂණයේදි ලබා ගත් ලකුණු සාධනයේ මිනුමක් ලෙස යොදාගත් අතර, එම ලකුණු මධ්‍යන්‍යයන් ශිෂ්‍ය කාණ්ඩ දෙකේ දැනුම් මට්ටමේ නිර්නායකය ලෙස භාවිතා කරන ලදි. සිසු නියැදි දෙකේ මධ්‍යන්‍යයන් සැසඳීමේදි පහත සඳහන් තොරතුරු අනාවරණය විණි.

01. ඉහළ සාධන මට්ටමක් දෙමාපිය සහාය ඇතිව අධ්‍යාපනය ලැබූ සිසුන් පෙන්නුම් කර තිබේ.

02. දෙමාපිය සහාය අවමව ලබමින් අධ්‍යාපනය ලැබූ සිසුන් අවම සාධන මට්ටමක් පෙන්නුම් කෙරේ.

03. පහළ ප්‍රාථමික අධ්‍යාපන සාධනයේදී දෙමාපිය සහාය පෙරමුණේ සිටී.

මේ අනුව හත්වන පරිච්ඡේදයේදී පහළ ප්‍රාථමික විෂයමාලා ක්‍රියාකාරිත්වය සඳහා දෙමාපිය සහාය අවශ්‍ය බවත්, දෙමාපිය සහාය නොමැතිව පහළ ප්‍රාථමික අධ්‍යාපන ක්‍රියාවලිය සාර්ථක කර ගත නොහැකි බවත්, අධ්‍යාපන සාධක වර්ධනය සඳහා දෙමාපිය සහාය වෙසෙයින් බලපාන බවත් නිගමනය විණි.

තවද දෙමාපියන් ළඟාතර ගැනීම පිළිබඳ ක්‍රියාදාමයේදී,

01. ගුරුදෙගුරු මිත්‍රශීලී පරිසරය වර්ධනය කිරීම.

02. උපක්‍රමයෙන් දෙමාපියන් පාසැල වෙත ඇඳ ගැනීම.

03. දරුවාගේ පාසැල 'මගේ පාසැලය' යන සංකල්පය දෙමාපියන් තුළ ඇති කරලීම

04. පාසැල බාහිර ලෝකය දෙසට විවෘත කිරීම තුළින් දෙමාපිය සහය ගත හැකි බවද අවධාරණය විණි.

පොදුවේ පහළ ප්‍රාථමික අධ්‍යාපන ක්‍රියාවලියේ ඵලදායිතා වර්ධනය සඳහා දෙමාපිය සහාය උපරිම මට්ටමකින් බලපාන බව මෙම අධ්‍යයනයෙන් නිගමනය වී ඇත.

University of Colombo Library

අවසාන වශයෙන් එහි උපග්‍රන්ථයෙන් දත්ත ලබා ගැනීම සඳහා සැකසුනු ගුරු නියැදි ප්‍රශ්නාවලියක් සිසු නියැදි පරීක්ෂණයට යොමු තෙරණු ප්‍රශ්න පත්‍රයක්, ගුරු නියැදියට යොමුවුණු පාසැල් නාමාවලියක්, සිසු නියැදි දෙකේ ලකුණු වාර්තාත්, සාඵල්‍යතා වර්ධිත අවස්ථා දැක්වෙන ඡායාරූප තිපයක් හා ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලියක් වෙයි.